# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2444/08 - 2025 ජූලි මස 07 වැනි සඳුදා - 2025.07.07**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: තිප්‍රාලේ/1/8/3/99 අත්.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: 4-3/7/2021/HW/28.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර:-*

**මෙරින්ඩ්‍රයිව් මාර්ග ව්‍යාපෘතිය යටතේ කොල්ලුපිටිය සිට ගෝල්ෆේස් දක්වා මාර්ග කොටස ඉදිකිරීම සඳහා ඉඩම් අත්කර ගැනීම (කි.මී. 1+200 - 2 +500)**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ (කොට්ඨාස අංක 37 කොළඹ මහ නගර සභා සීමාව තුළ) ගාලුමුවදොර ග්‍රාම නිලධාරී වසමේ කොල්ලුපිටිය ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද කැඩැස්තර සිතියම් අංක 520425 හා 2024.12.26 දිනැති සිතියමේ කැබලි අංක 1 - 6 වශයෙන් පෙන්නුම් කර ඇති හෙක්ටයාර් 0.6533 ක් පමණ වූ ඉඩම් කැබලිවල විස්තර පහත පරිදි වේ.

01. **කැබලි අංකය :- 01**
ඉඩමේ නම: ඉන්දියන් සාගරය; වර්තමාන ඉඩම් පරිහරණය: මුහුද, අත්හරින ලද පාලමක කොටසක් ඇත; හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය: රජය; වර්ගඵලය: හෙක්. 0.5978.

02. **කැබලි අංකය :- 02**
ඉඩමේ නම: සොයාගත නොහැක, වරිපනම් අංක- 2, 23 වන පටුමග; වර්තමාන ඉඩම් පරිහරණය: ගෙවත්ත; හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය: ශ්‍රී ලංකා යුධ හමුදාව; වර්ගඵලය: හෙක්. 0.0002.

03. **කැබලි අංකය :- 03**
ඉඩමේ නම: සොයාගත නොහැක, වරිපනම් අංක- 6, 23 වන පටුමග; වර්තමාන ඉඩම් පරිහරණය: ගෙවත්ත; හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය: එස්. පී. ෆොන්සේකා සහ ඒ. ඒ. එස්. ජේ. ෆොන්සේකා, අංක 578, ගාලු පාර, කොළඹ 03; වර්ගඵලය: හෙක්. 0.0013.

04. **කැබලි අංකය :- 04**
ඉඩමේ නම: සොයාගත නොහැක, වරිපනම් අංක– 10, 23 වන පටුමග; වර්තමාන ඉඩම් පරිහරණය: ගෙවත්ත; හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය: එල්. බී. ජයවර්ධන, අංක 15/1, 10 වන පටුමග කොළඹ 03; වර්ගඵලය: හෙක්. 0.0092.

05. **කැබලි අංකය :- 05**
ඉඩමේ නම: සොයාගත නොහැක, වරිපනම් අංක– 20, 23 වන පටුමග; වර්තමාන ඉඩම් පරිහරණය: ගෙවත්ත; හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය: ඒ. ඒ. ඩී. ඉන්දුලතා, අංක 630/3, ශ්‍රී සුභූති පාර, බත්තරමුල්ල; වර්ගඵලය: හෙක්. 0.0205.

06. **කැබලි අංකය :- 06**
ඉඩමේ නම: සොයාගත නොහැක; වර්තමාන ඉඩම් පරිහරණය: දුම්රිය රක්ෂිතය; හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය: සොයාගත නොහැක; වර්ගඵලය: හෙක්. 0.0243.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ


G 044762 - 29 (2025/07)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ **2025 අගෝස්තු මස 13 වැනි දින පෙ. ව. 10.00** ට තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා හමු විය යුතුයි.

තව ද, **2025 අගෝස්තු මස 06** වැනි දිනට මත්තෙන්, ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳව විස්තරත් වන්දි මුදල් හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

**සුගත් සිසිර කුමාර,**
ප්‍රාදේශීය ලේකම්,
තිඹිරිගස්යාය.

2025 ජූලි මස 04 වැනි දින,
තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 07 - 0067

---

## ශුද්ධි පත්‍රිකාව

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයේ*
*අංකය* : 4-3/10/2019/MV/183.
*මගේ යොමු අංකය*: 6/3/7/15/8/2/45.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තිය යටතේ අංක 2435/11 හා 2025.05.08 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ *ගැසට් පත්‍රයේ* පළ වූ සර්වේයර් ජනරාල්ගේ කැ.සි. අංක 310224, කලාප අංක 02 හා පත්‍ර අංක 01 සඳහන් කැබලි අංක 01, 02, 03 යන ඉඩම් කොටස් සඳහා හිමිකම් පරීක්ෂණ දිනය 2025.08.06 ලෙස සංශෝධනය විය යුතු බවත්, එකී ඉඩම් කොටස් සඳහා හිමිකම් කියන අයවලුන් 2025.07.31 දිනට මත්තෙන් තම හිමිකම සනාථ කිරීමට අදාළ ලේඛන ඉදිරිපත් කළ යුතු බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

**එස්. විජයකුමාර්,**
ප්‍රාදේශීය ලේකම්,
නාඋල.

2025 ජූලි මස 02 වැනි දින,
නාඋල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 07 - 0068

---

## ශුද්ධි පත්‍රිකාව

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයේ*
*අංකය* : 4-3/10/2020/MV/109.
*මගේ යොමු අංකය*: 6/3/7/15/5/7/8.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තිය යටතේ අංක 2435/11 හා 2025.05.08 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ *ගැසට් පත්‍රයේ* පළ වූ සර්වේයර් ජනරාල්ගේ කැ.සි. අංක 310208, කලාප අංක 03 හා පත්‍ර අංක 01 සඳහන් කැබලි අංක 01 යන ඉඩම් කොටස, සඳහා හිමිකම් පරීක්ෂණ දිනය 2025.08.06 ලෙස සංශෝධනය විය යුතු බවත්, එකී ඉඩම් කොටස් සඳහා හිමිකම් කියන අයවලුන් 2025.07.31 දිනට මත්තෙන් තම හිමිකම සනාථ කිරීමට අදාළ ලේඛන ඉදිරිපත් කළ යුතු බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

**එස්. විජයකුමාර්,**
ප්‍රාදේශීය ලේකම්,
නාඋල.

2025 ජූලි මස 02 වැනි දින,
නාඋල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 07 - 0069

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.